# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2012 අංක 17 දරන ද. මු. දසනායක සමාජ සේවා හා පුණ්‍ය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 අගෝස්තු මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.50 යි.** **තැපැල් ගාස්තුව :** රු. **10.00 යි.**

## 2012 අංක 17 දරන ද. මු. දසනායක සමාජ සේවා හා පුණ්‍ය පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 17/2011.

### ද.මු. දසනායක සමාජ සේවා සහ පුණ්‍ය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ද. මු. දසනායක සමාජ සේවා සහ පුණ්‍ය පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් හා එකී ඉල්ලීමට ඉඩ දීම යථෝචිත විය හැකි හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2012 අංක 17 දරන ද.මු. දසනායක සමාජ සේවා සහ පුණ්‍ය පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ද.මු. දසනායක සමාජ සේවා පුණ්‍ය පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) " ද.මු. දසනායක සමාජ සේවා සහ පුණ්‍ය පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, විධායක සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ද.මු. දසනායක සමාජ සේවා සහ පුණ්‍ය පදනම සංස්ථාගත කිරීම.

**3.** (1) ආයතනය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ස්වයං රැකියා හරහා රැකියා නොමැති සහ අඟ හිඟකම් ඇති තැනැත්තන් සඳහා වඩාත් යහපත් ජීවනෝපායක් සඳහා ඔවුන් සූදානම් කිරීමේ අදහස ඇතිව වෘත්තීය පුහුණු

2-PL 006025—2,590 (2011/05)

මධ්‍යස්ථාන පිහිටුවා වෙනත් පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ එමගින් ජනතාවගේ ආර්ථික මට්ටම ඉහල නැංවීම සහ එමගින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ දුගීභාවය තුරන් කිරීම;

(ආ) සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථාන සහ ආරෝග්‍යශාලා පිහිටුවීම සඳහා මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයකින් සහාය ලබා දීම මගින් දුෂ්කරතා සහ නොදියුණු ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම සහ රෝගීන් අතර බෙදා හැරීම සඳහා රෝහල්වලට සහ සෞඛ්‍ය මධ්‍යස්ථාවලට උපකරණ, බෙහෙත්, රෝද පුටු සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(ඇ) ආගමික හා ජාතික සමගිය දිරිමත් කරන වැඩ, වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඈ) තරුණයන්ගේ පෞරුෂත්වය වැඩිදියුණු කිරීමට දායක වන සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමාන වැඩසටහන් පැවැත්වීම සහ එමගින් වඩා ශිෂ්ට වූ සමාජයක් ගොඩනැගීම;

(ඉ) මිනිසා මගින් සිදුවන ආපදා හෝ ස්වාභාවික ආපදාවන්ගෙන් බලපෑමට ලක් වූ ජනතාව සඳහා නිවාස සහ මාර්ග ඉදි කිරීම මගින් සහ එම ජනතාවගේ සාමාන්‍ය දෛනික ජීවනෝපාය නැවත ආරම්භ කිරීම සඳහා ඔවුන්ට සහාය වීම ;

(ඊ) අගහිඟකම් ඇති සහ ලැබීමට සුදුසු වූ ශිෂ්‍යයන්ට පන්ති පැවැත්වීම මගින් පොත්පත්, උපකරණ සහ පාසල් නිල ඇඳුම් සපයා දීම මගින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදුරටත් කරගෙන යාම සඳහා ආධාර කිරීම සහ එවැනි ශිෂ්‍යයන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කර ගැනීම සඳහා මූල්‍යමය වශයෙන් හෝ අන්‍යාකාරයෙන් සහාය වීම ;

(උ) සංස්ථාව හා සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත්වීම සහ එමගින් එවැනි ආයතන අතර සම්පත් හුවමාරු කර ගැනීම සුසාදනය කිරීම ;

(උඉ) ජනතාවගේ ශාරීරික, මානසික, සමාජයීය සහ බුද්ධිමය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු සහ සමාන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ; සහ

(එ) මියගිය සොල්දාදුවන්ගේ පවුලේ සාමාජිකයන්ගේ යහපත හා සුභසාධනය සඳහා සුභසාධන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම;

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ මේ පනතේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එම ක්‍රියාත්මක කිරීම ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රීපුරුෂ භේදය හෝ දේශපාලන මතය පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොකර ක්‍රියාත්මක කරනු ලබන බවට සංස්ථාව වග බලාගත යුතු ය.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :— සංස්ථාවේ බලතල.

(අ) බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වසා දැමීමට ;

(ආ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමට හෝ එකතු කිරීමට සහ ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීමට හෝ එකතු කිරීමට:

එසේ වුව ද මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොසලකා පාලක සභාව විසින් සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතය ලබාගත යුතු ය;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි සහ එම කාර්යය සඳහා නිත්‍යානුකූලව අත්කර ගත හැකි යම් චංචල සහ නිශ්චල දේපල මිල දී ගැනීම, අත්කර ගැනීම, බදුදීම හෝ කුලියට දීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම සහ ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීමට;

(ඉ) සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම සහ ඔවුනට සංස්ථාවේ විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවීමට ;

(ඊ) ඍජුවම හෝ යම් නිලධරයකු හෝ ඒ සම්බන්ධයෙන් බලය පවරා ඇති යම් නියෝජිතයකු හරහා, සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා හෝ එහි අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් සහ එකඟතාවලට එළඹීමට, ඒවා ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීම ; සහ

(උ) සංස්ථාවේ අරමුණු සුදුසු සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි වෙනත් සියලු දේ කිරීමට.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව, සභාපතිවරයා, ලේකම්වරයා, සහකාර ලේකම්වරු දෙදෙනකු, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන වෙනත් සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත පාලක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) පාලක මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, හුදෙක් එහි සාමාජිකයන් අතර පවතින යම් පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයකු නම් කිරීම හෝ තෝරාපත් කර ගැනීමේ පවතින යම් දෝෂයක් නිසා හෝ වලංගු නොවන සේ නොසැලකිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, මේ පනතේ රීතිවලට අනුකූලව අලුත් පාලක මණ්ඩලයක්, ධුර පත් කරනු ලබන තෙක් එම පාලක මණ්ඩලයේ සාමාජිකයන් නොකඩවා ධුර දැරිය යුතු ය.

(4) පාලක මණ්ඩලයේ පදවි දරන සභාපතිවරයා වන ඉන්ද්‍රානි දසනායක මහත්මිය, කලින් ධුරයෙන් ඉවත් වුවහොත් මිස, පාලක මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු ය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ධුර අත්හැරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) පාලක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, කාර්ය, කර්තව්‍ය සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ විනය පාලනය ;

(ඉ) පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය, එකී රැස්වීම් පවත්වනු ලබන වේලාව, ස්ථානය, ඒ සම්බන්ධ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ සඳහා ගණපූරණය සහ එහි කටයුතු කරගෙන යාම ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යෑම සහ විගණනය කිරීම ; සහ

(උ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන්ම සහ එවැනි ම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධන කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**7.** යම් මිලට ගැනීමක්, දීමනාවක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල සහ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහිලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේනතු නීයාදන, දීමනා, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාරගන්නා ලද හෝ මින්මතු භාරගනු ලබන මුදල් පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ බැරට එක් බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින්, එහි දේපල පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් පිහිටුවනු ලැබිය හැකිය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු පදනමේ ණය හා බැරකම් නිදහස් කිරීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

**11.** (1) සංස්ථාව විසින් සංස්ථාවට ලැබෙන සියලුම ආදායම් සහ වියදම්, සහ වත්කම් හා බැරකම් පිළිබඳ සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**12.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තැබිය යුතු අතර, සංස්ථාවේ සභාපතිවරයා, ලේකම්වරයා සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමටකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ ද, ස්වකීය රීති විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. පාලක මණ්ඩලය විසින්, එම ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙර තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.